**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

**අදියර III විභාගය - ජනවාරි 2021**

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

**මූල්‍ය පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 9 කින් සමන්විත විය.**

**A කොටස, ලකුණු 5 බැගින් ප්‍රශ්න හතරකින්ද, B කොටස ලකුණු 10 ප්‍රශ්න 3 කින් සහ C කොටස ලකුණු 25 බැගින් ප්‍රශ්න 2 කින් ද සමන්විත විය.**

**බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්න 9 ටම දී ඇති කාලය තුළ පිළිතුරු දී ඇති බව නිරීක්ෂණය විය. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්න පත්‍රයේ කාර්යසාධනය සතුටුදායක විය.**

## A කොටස

### ප්‍රශ්න අංක 01

**මෙම ප්‍රශ්නය ව්‍යාපාරික පරිසරය මත දැනුම පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රශ්නය මගින් COVID -19 වසංගතය හේතුවෙන් බාහිර පරිසරය මත වෙනස් වීම් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගෙන් දැනුම අපේක්ෂා කරන ලදී. බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්නයන් විමසා ඇති දේ අවබෝධ කරගෙන හොඳින් පිළිතුරු දී තිබුණි.**

**මෙම වර්ගයේ ප්‍රශ්න සඳහා සාර්ථක පිළිතුරු දීමට පහත සඳහන් ඒවා පිළිබඳව අයදුම්කරුවන්ට දැනුම තිබිය යුතුය:**

- **ව්‍යාපාරික පරිසරය හඳුනාගැනීම (අභ්‍යන්තර සහ බාහිර පරිසරය).**
- **බාහිර පරිසරයේ බලවේග (උදා- ආර්ථික, නෛතික,තාක්ෂණික, සමාජීය).**
- **පාරිසරික බලවේගවල සාධක (උදා-ආර්ථික බලවේග සඳහා විනිමය අනුපාතය, පොලී අනුපාතය, බදු).**
- **නවතම දේශීය සහ විදේශීය මාතෘකා මත දැනුම්.**

**මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සාර්ථක මට්ටමක තිබුණි.**

### ප්‍රශ්න අංක 02

**මෙම ප්‍රශ්නයේ (a) කොටසින් අවදානම වැලැක්වීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට අවශ්‍ය විය. සමහර අයදුම්කරුවන්ට නිවැරදිව එහි තේරුම පැහැදිලි කිරීමට හැකි විය. කෙසේ නමුත් අදාළ නොවන පිළිතුරු දි තිබුණි. උදාහරණ ලෙස සමහර සිසුන් විගණන අවදානම විස්තර කර එය වළක්වන ආකාරය පැහැදිලි කර තිබුණි.**

**මෙම ප්‍රශ්නයේ 1 කොටසේ අවදානම අඩු කිරීමට භාවිතා කරන උපායමාර්ග දෙකක් හඳුනා ගැනීමට අවශ්‍ය විය. අයදුම්කරුවන් කිහිපදෙනෙක් අවදානම අඩුකිරීමේ උපායමාර්ග දක්වා සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි. කෙසේ නමුත් සමහර සිසුන් ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීම, නීති සහ රෙගුලාසි අනුගමනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වැනි අදාළ නොවන පිළිතුරු දී තිබුණි.**

**මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම මෙම ප්‍රශ්නයේ a කොටසින් සහතිකවීමේ කාර්යභාරය පිළිගැනීමේදී සහ කළමනාකරණ කිරිමේදී තිබිය යුතු ප්‍රධාන පැතිකඩ සහ අවශ්‍යතාවන් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරිණි. අයදුම්කරුවන් කීප දෙනෙක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට හැකිවිය. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පසුගිය වර්ෂයේ විගණක වාර්තාව පරික්ෂා කිරීමෙන්, කළමනාකරණ ව්‍යුහය, කොටස් හිමියන්ගේ සංයුතිය වැනි අදාළ නොවන පිළිතුරු දී තිබුණි.

මෙම මෙම ප්‍රශ්නයේ b කොටසින් සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග දෙකක් සඳහන් කිරීමට අවශ්‍ය විය. සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග පහක් තිබෙන අතර එය පැහැදිලිව ස්වඅධ්‍යයන පොතේ විස්තරාත්මකව දී තිබේ. කෙසේ නමුත් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය දුර්වල මට්ටමක තිබුණු අතර වෘත්තීය විනිශ්චය, ආචාරධර්ම, සාධාරණ තහවුරු කිරීම් වැනි අදාළ නොවන පිළිතුරු දී තිබුණි.

මෙම ප්‍රශ්නයේ කාර්යසාධනය සාර්ථක මට්ටමක නොතිබුණි.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයේ (A) කොටසින් විගණක කාර්යභාරයක තත්ත්ව පාලනයේදී සලකා බැලිය යුතු ප්‍රතිපත්ති දෙකක් හඳුනා ගැනීමට අවශ්‍ය විය. ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් නිවැරදි පිළිතුරු දී තිබූ බව නිරීක්ෂණය විය. තවද සමහර සිසුන් පහත පරිදි අදාළ නොවන පිළිතුරු දී තිබුණි:

- ආචාරධර්ම අනුගමනය කළ යුතුය
- වෘත්තීය ප්‍රමිත අනුගමනය කිරීම
- නෛතික හා නියාමන අවශ්‍යතාවයන්

මෙම ප්‍රශ්නයේ b කොටසින් සේවාදායකයකුගේ අවංකභාවය සම්බන්ධයෙන් තත්ත්ව පාලන පද්ධතියට ඇතුලත් කළ යුතු කරුණු තුනක් සඳහන් කිරීමට අවශ්‍ය විය සමහර සිසුන් වෘත්තීය සංශයදෘෂ්ටිය, මානව සම්පත්, නියාමනය වැනි  අදාළ නොවන පිළිතුරු දී තිබුණි.

මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සාර්ථක මට්ටමක තිබුණි.

# B කොටස

## ප්‍රශ්න අංක 05

ප්‍රශ්නයේ (a) කොටසින් ගිණුම්කරණ ප්‍රමිති ව්‍යවහාරකරන ආකාරය, විගණන ප්‍රමාණාත්මක භාවය මත පදනම්ව විගණන මතයට බලපාන්නේ කෙසේ දැයි පරික්ෂා කරන ලදී. බොහෝ සිසුන්ට ප්‍රශ්නයේ තොරතුරු මත ගිණුම්කරණ වැරදි අවබෝධ කරගන්නට  නොහැකි විය. එම නිසා ඔවුන්ට විගණන මතයට වන බලපෑම් පැහැදිලි කිරීමට නොහැකි විය. බොහෝ සිසුන් LKAS 16 දේපල පිරියත සහ උපකරණ සහ LKAS  2 තොග අනුව ගැලපිය යුතු දේ බව පිළිතුරු දී තිබුණි. නමුත් දී ඇති ප්‍රමාණාත්මක මට්ටම මත පදනම්ව විගණන මතයට තනි තනි ගිණුම්කරණ වැරදිවල බලපෑම් පැහැදිලි කර නොතිබුණි.

මෙවැනි වර්ගයේ ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ප්‍රමාණාත්මක මට්ටම මත පදනම්ව තනි තනි අයිතමවල බලපෑම සිසුන් සඳහන් කළ යුතුයි. ඊළඟට සියලුම අයිතම ප්‍රමාණාත්මක මට්ටමක සමස්තයක් ලෙස විගණන මතයට බලපාන්නේ කෙසේ දැයි සඳහන් කළ යුතුයි.

B කොටසින් විගණන මතය හැර විගණකගේ වාර්තාවේ ඇතුළත් කළ යුතු අයිතම තුනක් සඳහන් කිරීමට අවශ්‍ය විය. බොහෝ සිසුන් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු දී තිබූ බව නිරීක්ෂණය විය.

මෙම ප්‍රශ්නය කාර්යසාධනය මට්ටමක සාමාන්‍ය විය.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයේ **a** කොටසින් සමාගමක විගණනය භාර ගැනීමට පෙර සලකා බැලිය යුතු කරුණු 3ක් තක්සේරු කිරීමට අවශ්‍ය විය

ස්ව-අධ්‍යයන පොත හොඳින්අධ්‍යනය කළ අය දී ඇති සිද්ධි දාමය තේරුම්ගෙන නිවැරදි පිළිතුරු දීම නිරීක්ෂණය විය. කෙසේ වෙතත් පිළිතුරු දීමේදී ප්‍රශ්නයේ කරුණු ව්‍යවහාර කිරීමට සමහර සිසුන්ට නොහැකිවිය.

ප්‍රශ්නයේ **b** කොටසින් ස්වාධීනත්වයට තර්ජනයක් විය හැකි තත්ත්වයන් සඳහන් කිරීමට අවශ්‍ය විය. බොහෝ සිසුන් මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කොට නොගෙන නිවැරදි පිළිතුරු දීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. තවද සැලකිය යුතු සිසුන් පිරිසක් ස්වාධීනත්වය වන තර්ජනයන් වෘත්තීය ආචාරධර්ම මූලධර්මවලට අනුගතවීම තර්ජනයන් සමග පටලවා ගෙන තිබුණි.

මෙම ප්‍රශ්නය කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.

## ප්‍රශ්න අංක 07

ප්‍රශ්නයෙහි **A (a)** කොටසින් විගණක විසින් අනුගමනය කරන බාහිර තහවුරු කිරීමේ ක්‍රියාවලියේ අඩුපාඩු විස්තර කිරීමට අවශ්‍ය විය. ප්‍රශ්නයෙන් සෘණ තහවුරු කිරීමේ ක්‍රියාවලියට අදාල අඩුපාඩු සම්බන්ධයෙන් තොරතුරු දී තිබුණත් සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වීය.

ප්‍රශ්නයෙහි දී **A (b)** කොටසින් තහවුරු කිරීමේ ඉල්ලීම් විගණකට යැවීමට ඉඩ දීම කළමනාකරණය ප්‍රතික්ෂේප කරන විට විගණක විසින් ඉටු කරන ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කිරීම අවශ්‍ය විය. බොහෝ සිසුන්ට ප්‍රශ්නය අවබෝධ කරගැනීමට නොහැකි වූ අතර පසුගිය වර්ෂයේ විගණක ලිපිගොනු පරික්ෂා කිරීම, විශේෂඥයකුගේ සේවය ලබා ගැනීම, පසුගිය වර්ෂයේ බාහිර සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ විමසීම වැනි වැරදි පිළිතුරු සපයා තිබුණි

**(B)** කොටසින් මූල්‍ය ප්‍රකාශන විගණනෙය්දී පසුව සිදුවන සිද්ධි මත ඉටුකරන විමසීම් **4** ක් හඳුනා ගැනීමට අවශ්‍ය විය. පසුව සිදුවන සිද්ධීන් සම්බන්ධයෙන් විමසීම් වර්ග බොහෝ සිසුන් සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් ස්ව අධ්‍යායන පොතේ පැහැදිලි කිරීම් දී තිබේ කෙසේ නමුත් සමහර සිසුන්ට අදාළ විමසීම හඳුනා ගැනීමට නොහැකි වූ අතර වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් විමසීම, අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් විමසීම වැනි පොදු පිළිතුරු දී තිබුණි.

මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.

<u>C - කොටස</u>

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන් සමන්විත අතර **A** කොටස **(a),(b),(c),(d)** යනුවෙන් උප කොටස් 4 කින්ද **B** කොටස **a, b** සහ **c** කොටස් යනුවෙන් උප කොටස් 3 කින් සමන්විත වේ සමස්තයක් ලෙස ව්‍යාපාර ක්‍රියාවලින්, අභ්‍යන්තර පාලනය, පරිසරය සහ තොරතුරු තාක්ෂණ පාලනය වැනි සංකල්ප දී ඇති සිද්ධිදාමය මත පදනම්ව අයදුම්කරුවන්ගේ දැනුම පරික්ෂා කරන ලදී.

<u>**A** කොටස</u>

(a) මෙම කොටසින් සිද්ධි දාමයෙන් දී ඇති තොරතුරු මත පදනම්ව සමාගමේ අභ්‍යන්තර පාලන දූර්වලතා තුනක් හඳුනා ගැනීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරුණි. පිළිතුරු සිද්ධියේ ම ලබාගැනීමට පුළුවන් වේ. බොහෝ අයදුම්කරුවන්ට අපේක්ෂිත පිළිතුරු ලබාදීමට හැකි විය. කෙසේවෙතත් ගිණුම්කරණ පද්ධතිය නොමැතිවීම, තොග පද්ධතිය නොමැතිවීම ආදී සමහර සම්බන්ධිත නොවන පිළිතුරු තිබුණි.

(b) මෙම කොටසින් දී ඇති සිද්ධි සමාගමට අදාළ වන මෙහෙයුම් ,මූල්‍ය සහ අනුගත වීමේ පාලන උදාහරණ සමඟ විස්තර කිරීමට අවශ්‍ය විය කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය අවබෝධ කර ගෙන නොතිබුණි. තවද අයදුම්කරුවන්ගෙන් සමහරක් **(a)** කොටසේ දුන් පිළිතුරු ද නැවත මෙම කොටසටද දී තිබුණි. සමහර සිසුන් අදාළ පාලන විස්තර කර තිබූ නමුත් BIO සමාගමට අදාළ උදාහරණ දී නොතිබුණි.

(c) මෙම කොටසින් සිද්ධියට දී ඇති සමාගමට අදාළ ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලිය හතරක් ලයිස්තු ගත කිරීමට අවශ්‍ය විය. බොහෝ සිසුන් මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලින් වැනි අදාළ නොවන ක්‍රියාවලින් දී තිබුණි. ඔවුන් මිලදී ගැනීම, මුදල් කළමනාකරණය, විකුණුම් තොග කළමනාකරණය වැනි ක්‍රියාවලින් අමතක කොට තිබුණි.

(d) තොරතුරු තාක්ෂණය පොදු පාලන සහ යෙදවුම් පාලන වෙන් කොට දැක්වීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරිණි. සමහර සිසුන් ට එම දෙක අතර වෙනස දැක්වීමට නොහැකි වූ බව නිරීක්ෂණය විය. තවද සමහර සිසුන් පොදු පාලන සහ යෙදවුම් පාලන අතර වෙනස වෙනුවට ඒවාට අදාළ උදාහරණ දී තිබූ බව නිරීක්ෂණය කෙරිණි.

**B** කොටස

**(a)** මෙම කොටසින් අභ්‍යන්තර පාලන පද්ධතිය මත සිදුකළ ප්‍රකාශයේ වලංගුභාවය සාකච්ඡා කිරීම අවශ්‍ය විය හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියෙන් වංචා සහ වැරදි ඉවත් වන බව යන කරුණු එම ප්‍රකාශයේ සමන්විත වේ. බොහෝ අයදුම්කරුවන් ප්‍රකාශය නිවැරදි නොවන බවත් අභ්‍යන්තර පාලනයේ ආවේණික සීමා දී තිබුණි.

**(b)** මෙම කොටසින් අභ්‍යන්තර පාලනයේ තේරුම විස්තර කිරීමට අවශ්‍ය කෙරිණි. බොහෝ අයදුම්කරුවන්ට අපේක්ෂිත පිළිතුරු සැපයීමට හැකිවිය. කෙසේවෙතත් අයදුම්කරුවන් ව්‍යාපාරයේ තත්ත්වය පාලනය, විගණනයේ මෙහෙයුම් මූල්‍ය සහ අනුගත වීමේ පාලනය වැනි වෙනත් පාලන ඒ පිළිබඳව අවබෝධයකින් තොරව විස්තර කර තිබුණි.

මෙම කොටසින් COSO අනුව අභ්‍යන්තර පාලන පද්ධතියේ උපාංග 2 ක් සඳහන් කිරීම අවශ්‍ය වේ. බොහෝ සිසුන් නිවැරදිව පිළිතුරු දී තිබුනද සමහර සිසුන් පහත සඳහන් අදාල නොවන පිළිතුරු දී තිබුණි.

- වැඩ බෙදීම.
- භෞතික පාලනය.
- තත්ත්ව පාලන.
- ආචාර්ය ධර්ම අවශ්‍යතාවයන්.

ප්‍රශ්නය සඳහා සමස්තයක් ලෙස කාර්ය සාධනය සාර්ථක මට්ටමක තිබුණි.

## ප්‍රශ්න අංක **09**

මෙම ප්‍රශ්නය කොටස් දෙකක් වන අතර A කොටස a,b,c,d සහ e උප කොටස්වලින් **B** කොටස **a** සහ **b** යන උප උප කොටස් වලින්ද සමන්විත වේ.

**(a)** මෙම කොටස කොටසේ දී ඇති සිද්ධිය මත පදනම්ව විශේෂ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම අපේක්ෂිතයි. බොහෝ සිසුන්ට නිවැරදි පිළිතුරු දීමට අපොහොසත් වූ අතර සිද්ධිය නැතිව පොදුවේ පිළිතුරු දී තිබුණු බවද සමහර සිසුන් පහත පරිදි අදාළ නොවන පිළිතුරු දී තිබුණි:

- පසුගිය වර්ෂයේ කාර්යභාර ලිපියේ භාවිතය
- ප්‍රධාන විධායක නිළධාරී තුමාගෙ කාර්යසාධනය

- නිෂ්පාදිත පිරියතේ කාර්යක්ෂමතාවය
- වාර්තාවල සම්පූර්ණත්වය

**(b)** මෙම කොටසේ කාර්යභාරය ලිපිය සංශෝධන කිරීමේ කොන්දේසි පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී කොන්දේසි වෙනුවට කාර්යයන් ලිපියේ ඇතුලත් කරුණු පිළිතුරු ලෙස දී තිබුණි. තවද පහත සඳහන් අදාල නොවන පිළිතුරු ද සමහර සිසුන් දී තිබුණි.

- විගණන ගාස්තු
- කාර්යභාර ලිපියේ වගකීම්
- සේවාදායකයාගේ ලිපිනය

**(c)** විගණනය සැලසුම් කිරීම සහ ඉටු කිරීමේදී වෘත්තීය පැතිකඩ පිළිබද සිසුන්ගේ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ සිසුන් අදාල නොවන පැතිකඩ සඳහන් කර තිබූ බව නිරීක්ෂණය විය.

උදාහරණ ප්‍රසාද දීමනාව, ප්‍රධාන විධායක නිළධාරී තුමාගේ කාර්යසාධනය.

**(d)** දී ඇති සිද්ධිය මත පදනම්ව සැලකිය යුතු අවදානම යන දෙය විස්තර කිරීම පිළිබඳ සිසුන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ සිසුන් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අපොහොසත් වූ අතර විකුණුම් වැඩියෙන් පෙන්වා තිබීම දක්වා තිබුණි. වංචාවේ අවදානම සැලකිය යුතු අවදානමක් පෙන්නුම් කරන සාධකයක් වේ

**(e)** මෙම කොටසේ විකුණුම් සඳහා විගණනය සම්බන්ධ ව්‍යවහාර කිරීම පිළිබඳව සිසුන්ගේ දැනුම් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් විකුණුම් වලට වැඩි අවධානයක් නොමැති ව ණයගැති ශේෂ සත්‍යාපනය දකවා තිබීම නිරීක්ෂණය විය. තවද බොහෝ සිසුන් පහත සඳහන් පොදු විගණන පටිපාටි සපයා තිබූ බව නිරීක්ෂණය විය:

- විමසීම
- පරීක්ෂා කිරීම
- නැවත ගණනය
- නිරීක්ෂණය

**<u>B</u> කොටස**

**(a)** මෙම කොටසින් අස්තිත්වයක අඛණ්ඩ පැවැත්ම මත සැලකිය යුතු සැකයන් පැන නගින මූල්‍ය ඇඟවීම් පිළිබඳ සිසුන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ සිසුන් ආනයන සැපයුම්කරුවන්ගේ හිඟකම, අවසන් නොවූ නඩු තීන්දුව වැනි මූල්‍ය නොවන සහ වෙනත් ඇඟවීම්, මූල්‍ය ඇඟවීම් වෙනුවට සඳහන් කර තිබූ බව නිරීක්ෂණය විය.

**(b)** මෙම කොටසින් අඛණ්ඩව පැවැත්ම සම්බන්ධ සිද්ධි හෝ තත්ත්වයන් හඳුනා ගන්නා විට විගණක විසින් ඉටු කළ යුතු විගණන පටිපාටි සඳහන් කිරීම අවශ්‍ය කෙරේ. සුළු අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුර දී තිබුණත් බහුතරයක් විමසීම, නිරීක්ෂණ, පරීක්ෂා කිරීම වැනි පිළිතුරු දී තිබුණි.

මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -